# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு**
**Ministry of Women, Child Affairs and Social Empowerment**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>**எனது இல**<br>**My No** DSD/HO/07/SD/07/23-චක්‍රලේ. | ඔබේ අංකය<br>**உமது இல**<br>**Your No** | දිනය<br>**திகதி**<br>**Date** 2024.02.14 |

***සමෘද්ධි චක්‍රලේඛ අංක : සමාජ සංවර්ධන හා පරිසර 2024/05***

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමාජ සංවර්ධන විෂයභාර දිස්ත්‍රික් කළමනාකරුවන් ,
සියළුම බැංකු සමිති කළමනාකරුවන්,
සියළුම සමාජ සංවර්ධන සහකාර නිලධාරින් වෙත.

**සමෘද්ධි සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන - 2024**

වසර 2030 වන විට දුගී බවෙන් තොර සවිබල ගැන්වූ ප්‍රජාවකින් හෙබි සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වේ. ඒ අනුව සමෘද්ධි ව්‍යාපාරය දිළිඳු සහන වැඩපිළිවලකට පමණක් සීමා නොවී දුප්පත් හා අන්ත දුප්පත් කාණ්ඩවලට අයත් සමාජ කණ්ඩායම් ආර්ථික, සාමාජීය, මානසික, සෞඛ්‍ය හා පාරිසරික යන අංශවලින් සවිබල ගැන්වීම 2024 වර්ෂයේ සමෘද්ධි දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වේ.

02. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජන ජීවිතය සංවර්ධනය කිරීම සඳහා බොහෝ ආර්ථික වැඩසටහන් ක්‍රියාවට නංවා ඇතත්, දිනෙන් දින වර්ධනය වන සමාජීය ගැටලු නිසා අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟාවීමට නොහැකි වී ඇත. ප්‍රජාවගේ මානසික හා සමාජීය ගැටලු වලට ආමන්ත්‍රණය කිරීම සඳහා බොහෝ ආයතනගත නිළධාරින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් රාජකාරිවල නිරතව ඇතත්, ඔවුන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු නොකිරීම නිසා පොදුවේ ග්‍රාමීය ප්‍රජාව මුහුණ දෙන ගැටළුවලට තිරසාර විසඳුම් ලබා ගැනීමට නොහැකි වී ඇත.

එම අභියෝග ජය ගැනීම සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඇති සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් ඇතුළු සියලු සමාජ සංවර්ධන සහකාර නිලධාරීන්, වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා ප්‍රජා නායකයින්ගේ ක්‍රියාකාරි දායකත්වය ඇතිව ආර්ථික සමාජීය ගැටළුවලට විසඳුම් ලැබෙන ආකාරයට සමස්ථ සමාජ සංවර්ධන වැඩසටහනම පෙළගස්වා ඇත.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

ඒ අනුව අවාසිසහගත තත්වයට පත් ජනතාව ආර්ථික, සාමාජීය, සංස්කෘතික, මානසික සෞඛ්‍ය හා පාරිසරික වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා ඵලදායි වැඩසටහන් ප්‍රජා සහභාගිත්වය ලබා ගනිමින් 2024 වසරට ක්‍රියාත්මක කිරීමට සමාජ සංවර්ධන හා පරිසර අංශය වැඩසටහන් පෙළගස්වා ඇත. එබැවින් ප්‍රාදේශීය මට්ටමින් සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරින් සහභාගි කරගෙන පහත සඳහන් සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

**01. මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය, ගෘහ කළමනාකරණ හා සතුටු පවුල් වැඩසටහන.**

වර්තමානය වනවිට, දුම්වැටි මත්වතුර හා නොයෙකුත් අහිතකර මත්ද්‍රව්‍යවලට ප්‍රජාව, තරුණ තරුණියන් හා දරුවන් ඇබ්බැහිවීම විශාල වශයෙන් වැඩි වී ඇත. එබැවින් මෙම ඇබ්බැහිවීම් වැලැක්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. විශේෂයෙන් තෝරාගන්නා ලද ආදර්ශ ගම්මාන තුලද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා උපදේශන ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඇති නිලධාරින් ගේ මූලිකත්වය ගෙන කටයුතු කළ යුතු වේ.

මීට ඉහත අංක DSD/HO/07/SD/02/05 හා 2023.12.07 දිනැති ලිපියෙන් එවා ඇති සමීක්ෂණ තොරතුරු පදනම් කරගෙන ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට නියමිත මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සම්බන්ධයෙන් වෙනම උපදෙස් පත්‍රිකාවක් ලබා දීමට නියමිත වේ.

ගෘහ කළමනාකරණ හා සතුටු පවුලක් මේ තුලින් ඇති කිරීම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම්ද සිදුකළ යුතුව ඇත. විශේෂයෙන් දුම්වැටි හා මත්ද්‍රව්‍ය වලින් ප්‍රජාව මුදා ගැනීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේ දී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතනවල න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ඇති සම්පත් දායකයින් යොදාගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා වූ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අදාල සැලසුම් සකස් කරගත යුතුවේ.

**02. සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය වැඩසටහන**

දැයේ දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම මෙන්ම අනාගත වැඩ ලෝකයට ගැලපෙන අයුරින් දරුවන් නිර්මාණය කිරීම සඳහා අවු 05 – 18 අතර වයසේ පසුවන දරුවන් ග්‍රාමීය මට්ටමින් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා ඒකරාශී කරමින් ඔවුන් සමග විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙමින් දැනුම, ආකල්ප, කුසලතාවලින් පිරිපුන් ගුණ නුවණින් යුතු අභියෝග ජය ගත හැකි දරුවන් දැයට දයාද කිරීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂිතය.

2023 වසරේ සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය යටතේ කළාප, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් තරඟ පැවැත්වීමේ දී දරුවන්ට සිදුවූ යම් යම් ගැටළුකාරි තත්වයන් සම්බන්ධයෙන් නොයෙකුත් පැමිණිලි දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති හෙයින් මෙම තරඟාවලිය පැවැත්වීම සම්බන්ධයෙන් 2024 වර්ෂයට නව චක්‍රලේඛනයක් ලබාදීමට නියමිත බවත් ඒ අනුව කටයුතු කිරීමටත් බලාපොරොත්තු වේ.

**03. ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

2024 වසරට අදාලව පහත පරිදි ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරගත යුතුවේ.

1. ***ජාත්‍යන්තර කාන්තා දින (මාර්තු 8)***
    - ගර්භනී මාතාවන් සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්
    - අඩු ආදායම්ලාභි ගර්භනී කාන්තාවන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම, සායන පැවැත්වීම සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන්, බෝ නොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම ආදි වැඩසටහන්
    - කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම හා ඔවුන් ගේ සමාජ ආරක්ෂාව සැලසීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
    - කාන්තාවන්ට එරෙහිව හිංසනය හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශන සේවාවන් ලබාදීම.
    - මත්ද්‍රව්‍ය හා දුම්වැටියට එරෙහිව කාන්තා හඬක් නැගීම. වැනි වැඩසටහන් 2024 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව වසර පුරා ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

2. ***ජාත්‍යන්තර දුම්වැටි හා මත්විරෝධී දිනය (මැයි 31)***
    - මේ සම්බන්ධයෙන් උපදෙස් පත්‍රිකාවක් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.

3. ***ජාත්‍යන්තර සාක්ෂරතා දිනය (සැප් 08)***

4. ***ජාත්‍යන්තර ළමා හා වැඩිහිටි දිනය (ඔක්. 01)***

5. ***ජාත්‍යන්තර දිළිඳුකම පිටු දැකීමේ දිනය (ඔක්. 17)***

මෙම සියළු වැඩසටහන් සමාජ සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත වන අතර ඒ ඒ දිනයන්ට අදාලව වෙන වෙනම උපදෙස් පත්‍රිකා හා චක්‍රලේඛ නිකුත් කිරීමට නියමිතව ඇත.

**04. සනීපාරක්ෂක පහසුකම් සැපයීම් වැඩසටහන**

මේ යටතේ වඩාත් සුදුසු ප්‍රමුඛතාවය දැක්විය යුතු ඉල්ලීම් සීමිත ප්‍රමාණයක් පසුගිය වසරවල ලැබී ඇති අතර එම ඉල්ලීම්වලට ප්‍රමුඛතාවය ලබාදෙමින් භාණ්ඩාගාර මුදල් ලැබීම මත සිදු කිරීමට නියමිතව ඇත.

**05. නිපුණතා සංවර්ධණ පුහුණු වැඩසටහන**

සමාජ සංවර්ධන විෂයට අදාලව කටයුතු කරන සියලු නිලධාරී කාර්යමණ්ඩලවල කුසලතා වර්ධනය කිරීම උදෙසා වන පුහුණු වැඩසටහන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. දැනට බැංකු සමිතිවලට අනුයුක්ත කර සිටින සමාජ සංවර්ධන සහකාර වරුන්ගේ වැඩි පිරිසක් වැඩසටහනට අදාල මූලික පුහුණුවීම් ලබාගෙන නොමැති බැවින් ඔවුන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂා කෙරේ.

**06. පහ වසර දරුවන් සඳහා ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන සහ මානසික සංවර්ධන වැඩසටහන**

පසුගිය වසරේ මෙන්ම මෙම වර්ෂයේ ද ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින අඩු ආධායම්ලාභී පවුල්වල 5 වසර දරු දැරියන් සඳහා ප්‍රවීණ ගුරුභවතුන්ගේ සහය ලබාගෙන ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුව ඇත. ඊට සමගාමීව දරුවන්ගේ මානසික සංවර්ධනය, මානසික සංතෘප්තිය ඇති කිරීම සඳහා වන ආධ්‍යාත්මික හා රසවින්දනාත්මක වැඩසටහන් ද මීට සමගාමීව පැවැත්වීමට කටයුතු කළ යුතු වේ.

**07. පිවිතුරු වෙරළක් වැඩසටහන**

සමුද්‍ර දූෂණය අවම කිරීම සඳහා ප්‍රජා සහභාගීත්වය මගින් තිරසාර ලෙස වෙරළ භාවිතා කිරීම සඳහා වෙරළ රැක බලාගන්නන් (Beach care – takers) ස්ථාපිත කිරීමේ අරමුණින් සමුද්‍රීය පරිසර දෙපාර්ත මේන්තුව එක්ව අවබෝධතා ගිවිසුමකට අනුව පසුගිය වසරේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ අතර 2024 වසර සඳහා නව අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමෙන් අනතුරුව වැඩසටහන ක්‍රියාවට නැංවීමට නියමිතව ඇත.

එහි ප්‍රගතිය පසුගිය වසරේදී ලබාදී ඇති ආකෘතිය පරිදි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට මාසිකව එවිය යුතුය. නව උපදෙස් සහිත උපදෙස් ලිපියක් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ලබාදීමට නියමිත වේ. මෙම කාර්යය වෙරළ ආශ්‍රිත දිස්ත්‍රික්ක 14ක් තුල, වෙරල ආශ්‍රිත ප්‍රතිලාභීන් සම්බන්ධ කරගෙන ඔවුන්ට යම් දීමනාවක් සමෘද්ධි  බැංකුව හරහා ලබාදෙමින් ක්‍රියාත්මක වේ.

**08. කාලීන අවශ්‍යතා අනුව සමාජ සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කළයුතු විශේෂ වැඩසටහන්**

**09. ප්‍රගති සමාලෝචන වැඩමුළුව පැවැත්වීම.**

***i.* *දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය***

සමස්ථ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය සොයා බැලීම සඳහා විෂයට අදාල නිලධාරීන් දිස්ත්‍රික්කයට කැඳවා කාර්තුවකට එක් ප්‍රගති සමාලෝචනයක් බැගින් සිදු කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් නිලධාරීන් කැඳවීම සුදුසු වේ.

i. දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂයභාර කළමනාකරු/ සමාජ සංවර්ධන විෂය පැවරි ඇති සමෘද්ධි සංවර්ධන නිලධාරි

ii. විශේෂ නිවාස වැඩසටහන භාරව කටයුතු කරන කළමනාකරු

iii. බැංකු සමිති කළමනාකරු

iv. දිස්ත්‍රික්කයේ සියලුම සමාජ සංවර්ධන සහකාරවරුන්

**ii. ජාතික ප්‍රගති සමාලෝචනය**

මාස 06 කට වරක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට කැඳවා සමස්ථ වැඩසටහනේ ප්‍රගතිය හා ඉදිරි කටයුතු සාකච්ඡා කිරීම. (Presentation මගින්)
ඒ සඳහා පහත සඳහන් නිලධාරින් කැඳවීමට නියමිත වේ.

i. දිස්ත්‍රික් විෂයභාර කළමනාකරු

ii. සමාජ සංවර්ධන සහකාරවරුන්

iii. විශේෂ නිවාස වැඩසටහන භාරව කටයුතු කරන කළමනාකරු

ඉහත සමස්ථ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වමි. මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය සෑම මසකම එළඹෙන මස 05 දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබාගෙන සකස්කර ගත් දිස්ත්‍රික් වාර්තාව සෑම මසකම එළඹෙන මස 10 දිනට පෙර සමාජ සංවර්ධන අංශයට ලබාදිය යුතුය. (ඇමුණුම I)

ප්‍රජාමූල ප්‍රාදේශීය සංවිධාන හා වෙනත් පරිත්‍යාග ශීලීන්ගෙන් ලබාගන්නා අරමුදල් (භාණ්ඩාගාර නොවන අරමුදල) යොදාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඇති සමාජ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතියද ඉහත දිනටම ලබාදීමට කටයුතු කළ යුතුවේ. ( ඇමුණුම II)

සියළු වාර්තාවල ප්‍රගතිය ඉදිරිපත් කිරීමේ දී ගැහැණු, පිරිමි වශයෙන් වෙන්කර දැක්වීම සිදුකළ යුතුවේ.

සමාජ සංවර්ධන වැඩසටහනට අදාල ප්‍රගතිය කඩිනමින් ලබාදීමට socialdev@samurdhi.gov.lk ඊ-මේල් ලිපිනය හෝ 0112889005 දරන Fax අංකය භාවිතා කළ හැකි අතර එය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යක්ෂ විසින් සනාථ කළ යුතු වේ.

සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශිය සංවිධාන, ප්‍රජාමූල සංවිධාන අරමුදල් යොදාගැනීමෙන් (කොඩි අරමුදල්) හා 2024 වර්ෂයේ භාණ්ඩාගාර මුදල් ලදහොත් එම මුදල් යොදාගැනීමෙන් ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාකාරි සැලසුම් ප්‍රාදේශීය මට්ටමින් සකසා ගතයුතු වේ.

2024 වර්ෂයේ සමාජ සංවර්ධන අංශය සමාජීය, සෞඛ්‍ය, මානසික හා පාරිසරික වශයෙන් ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන ඉහත පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. ඒ අනුව සමාජ සංවර්ධන සහකාර නිලධාරින් සඳහා පහත ඉලක්ක ලබාදීමට නියමිත වේ. එම ඉලක්ක ගත ප්‍රජාව 2024 දෙසැම්බර් මස වන විට සමාජීය වශයෙන් සවිබල ගැන්වීම ප්‍රධාන අරමුණ වේ.

**ඉලක්ක**

1. සෑම සමාජ සංවර්ධන සහකාර නිලධාරියෙක්ම මත්ද්‍රව්‍ය නිවාරණ සමීක්ෂණ වාර්ථාවට අනුව තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් තෝරාගත් පවුල් 10 ක් සියළු මත්කාරක ද්‍රව්‍යවලින් මුදාගත යුතු වේ.
2. සෑම සමාජ සංවර්ධන සහකාර නිලධාරියෙක්ම තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් 10 ක් ආර්ථික, සමාජීය, සංස්කෘතික, සෞඛ්‍ය, මානසික හා පාරිසරික වශයෙන් සවිබල ගැන්විය යුතුවේ .

මේ සඳහා අවශ්‍ය කරන පවුල් තෝරා ගැනීම වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි සහභාගිත්වයෙන් සිදුකර, සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල නියෝජිතයින් සියළුම සංවර්ධන නිලධාරින් සියළු කලාප හා සමිති කළමනාකරුවන් හා දිස්ත්‍රික් විෂයයභාර නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් මෙම සමාජීය සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු අතර එහි වගකීම සමෘද්ධි සංවර්ධන නිලධාරි, සමාජ සංවර්ධන සහකාර, බැංකු සමිති කළමනාකරු හා විෂයයභාර දිස්ත්‍රික් කළමනාකරු සතුවන අතර සම්පූර්ණ වැඩසටහන අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කටයුතු සිදු කිරීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන් විසින් සිදු කළ යුතුවේ.

2024 වර්ෂයේ අවසාන කාර්තුව වනවිට සමාජ සංවර්ධන වැඩසටහන් තුළින් සවිබල ගැන්වූ පවුල්වල සම්පූර්ණ තොරතුරු ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශයට ගෙන්වා ගැනීමට අපේක්ෂා කරන අතර මාසිකව මෙම කාර්යය දිස්ත්‍රික් කාර්යාලය විසින් පසුවිපරමට ලක් කළ යුතු අතර මාසික වාර්තා ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශයට එවිය යුතු වේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සඳහා අංක 0112889046 හා 0112876601 මගින් සමාජ සංවර්ධන අංශය ඇමතීමෙන් ලබාගත හැකිය.

සී.ඩී. කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා. දැ.ගැ.ස
3. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ගැ.ස
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ගැ.ස
5. සියළුම අංශ ප්‍රධානින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ගැ.ස